රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ : 20/2018

මගේ අංකය : EST-6/06/TVL/3030
රාජ්‍ය පරිපාලන, කළමනාකරණ සහ
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය
නිදහස් චතුරස්‍රය
කොළඹ 07.

2018.08.21

අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්

## ආයතන සංග්‍රහයේ XIV වැනි පරිච්ඡේදයේ 4 වගන්තිය සංශෝධනය කිරීම සංයුක්ත දීමනාව

ආයතන සංග්‍රහයේ XIV වැනි පරිච්ඡේදයේ 4:4:3 හා 4:5 උප වගන්ති කෙරෙහි ඔබගේ අවධානය යොමු කරවමි.

02. එම උප වගන්ති පහත පරිදි සංශෝධනය කිරීමට 2018.07.24 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේ දී තීරණය කර ඇත.

4:4:3 නිලධරයෙකු පැය 24ට වඩා අධික කාලයක් කාර්ය ස්ථානයෙන් පිටත ගතකරන විට සති තුනක උපරිම කාල සීමාවක් දක්වා, ඒ එකිනෙක පැය 24ක කාල පරිච්ඡේදය සඳහා සංයුක්ත දීමනාවෙන් 50%ක අමතර දීමනාවක් ඔහුට ගෙවිය හැකි ය. සංයුක්ත දීමනාවෙන් 50%ක අමතර දීමනාව පැය 24ට අඩු කුමන කාල පරිච්ඡේදයක් සඳහා වුවද ගෙවිය නොහැකිය.

4:5 ගාස්තු ප්‍රමාණය - ගෙවිය යුතු සංයුක්ත දීමනාවේ ප්‍රමාණය නිගමනය කළ යුත්තේ පහත දැක්වෙන පරිදි නිලධරයාගේ මාසික වැටුප පදනම් කරගෙනය. (1:3 උප වගන්තිය බලන්න)

| මාසික මූලික වැටුප | පැය 24ක එක් එක් සම්පූර්ණ කාල පරිච්ඡේදය සඳහා සංයුක්ත දීමනාව |
|---|---|
| රු.32,779.00 දක්වා | රු.700.00 |
| රු.32,780.00 සිට රු.43,479.00 දක්වා | රු.800.00 |
| රු.43,480.00 සිට ඉහළට | රු.1,000.00 |

03. ඉහත විධිවිධාන 2018.08.23 දින හෝ එදිනෙන් පසු යෙදෙන රාජකාරී ගමන් සඳහා අදාළ වේ.

04. මෙම චක්‍රලේඛය මහා භාණ්ඩාගාරයේ එකඟතාව ඇතිව නිකුත් කරනු ලැබේ.

පද්මසිරි ජයමාන්න
ලේකම්
රාජ්‍ය පරිපාලන, කළමනාකරණ සහ
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය